# 'රටකින් එහා ' ප්‍රසංගයට පසු වදනක්

පෙබරවාරි මස 24 වෙනි සෙනසුරාද බ්‍රිස්බේ-න් හි ෆොරස්ට්ලේක් ස්ටේට් පාසැල් ශාලාවේදී ශ්‍රී ලංකාරාම මහා විහාරයට ආධාර පිණිස පැවැත්වුණු ප්‍රියා සූරියසේන ගායකයාණන්ගේ 'රටකින් එහා' ප්‍රසංගයට පසුවදනක් ලියන්නට මා පෙළඹවූ කාරණා කීපයකි.

ඇත්තෙන්ම එය සවස හයට ආරම්භ වන බව සඳහන් වුවද, ශ්‍රී ලාංකිකයන්ගේ සුපුරුදු ප්‍රමාදයට අනුව වේලාව පැයක් පසුපසට ගියේ ප්‍රේක්ෂකයන්ගේ නොඉවසිල්ල වැඩි කරමින්.

කෙසේ වෙතත් ප්‍රියා සූරියසේන වැන්නෙකුව බ්‍රිස්බේන් වලදී දකින්නට ලැබීමත් සතුටක්. අපි පාසැල් සමයේදී මිල්ටන් මල්ලවාරච්චි, අමර-දේව, ගුණදස කපුගේ වැනි ගායකයන් අතරට ආ ප්‍රියා සූරියසේනයන් ගේ කටහඬ හොඳින් අපගේ මතකයේ රැඳෙන්නටත්, රසිකාවියන් ලෙස අප ඔහුගේ ගීත වලට ඇළුම් කරන්නටත් හේතු පාදක වූයේ මිල්ටන්, අමරදේව, කපුගේ වැනි ගායකයන්ට වඩා




මේනකා ජයතිලක

ක්වීන්ස්ලන්තය


වෙනස්ම කටහඬක් ප්‍රියා සූරියසේනයන් සතුවූ නිසයි. ඒ මීට අවුරුදු විස්සකට පමණ කලින්.

'මගේ ලමැද සුව යහනක්' ගීතයෙන් ආරම්භ වුණු ප්‍රසංගයේ සෑම සින්දුවක් අවසානයේදීම ප්‍රේක්ෂකයන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය අති විශාල වුණා. ඇත්තෙන්ම හැත්තෑව දශකයේ සිට ඔහු ගැයූ ගීත එම හඬින්ම අදටත් අසන්නට ලැබීම මෙහි වෙසෙන ශ්‍රී ලාංකිකයන් ලැබූ විශාල භාග්‍යයක්. අවාසනාවකට මෙන් අති විශාල ජනතාවකගේ සහභාගිත්වයක් නොතිබුණාද , ප්‍රසංගයට ලැබුණු ප්‍රතිචාරයේ කිසිදු අඩුවක් තිබුණේ නෑ.

බ්‍රිස්ලන්කන් සංගීත කණ්ඩායමේ අති මහත්

<u>*තම මහන්සිය මදක් අමතක කොට ප්‍රේක්ෂකයන් සමඟ සුහද කතා බහක යෙදෙන්නට ප්‍රසංගය අවසා-නයේදී තව පැය බාගයක් හෝ මිඩංගු කරන්නට  ප්‍රියා සූරියසේන ගායකයාණන්ට  පුළුවන්කමක් තිබුණා නම්...*</u>

කැපවීම, දක්ෂතාවය මෙන්ම යුග ගායනයෙන් සහාය වුණු තිලංගි, සිත්ති, උපමාලිකා සහ අසෝක රටකින් එහා ප්‍රසංගයට යුග ගායනයෙන් සහාය වීමට ප්‍රවීණයන් නැති අඩුව සම්පූර්ණ කළේ ප්‍රියා සූරියසේනයන්ද පුදුමයට පත් කරවමින්.

වර්තමාන ශ්‍රී ලංකාවේ හතු පිපෙන්නාක් මෙන් බිහිවන ගායකයන් ගැනද යමක් කියන්නට ඔහු අමතක කළේ නැහැ. ලංකාව මෙන් හැට ගුණයක් විශාල වූ ඉන්දියාවේද සිටින්නේ ගායකයන් හයදෙනෙකු යැයි සඳහන් කළ ඔහු, මේ වන විට ලංකාවේ ගායකයන් හයසීයක් පමණ සිටින බවත්, තව මාස හයක් ගත වන විට එය හයදහස දක්වා වැඩි වුවහොත් ලාංකිකයන් වන අපි ඒ ගැන පුදුම විය යුතු නැති බවත් සඳහන් කළේ පැමිණ සිටි ප්‍රේක්ෂකයන්ද සිනහවට පත් කරමින්.

'හතු පිපෙන්නාක් මෙන් බිහිවන ආධුනික ගායක ගායිකාවන් ගෙන් විශේෂයෙන්ම සංගීත සංදර්ශණ වලදී ලැබෙන සැලකීම කෙබඳුදැ'යි රසිකාවියන් වෙතින් නැගුණු පැනයට ඉතා දීර්ඝ වශයෙන් පිළිතුරු දුන් ප්‍රියා, ප්‍රවීණයන් උදෙසා ආධුනිකයන්ගේ ගරු සැලකිලි වල කිසිදු අඩුවක් නැති බව සඳහන් කළත්, හුගාක් ප්‍රවීණයන් ආධුනිකයන් ගේ ගරු සැලකිලි වල ඇති අඩුපාඩුකම් ගැන පුවත්පත් ලිපි මගින් හෙළි කරන අයුරු අප කියවා තියෙනවා. සමහර විට එය ප්‍රවීණයන්ට සිදුවන අසාධාරණයක් වුවත්; ප්‍රියා වැන්නවුන් ඒ ගැන එතරම් තැකීමක් නොකරනවා විය හැකියි. මෙකල ලංකාවේ ඉතා ජනප්‍රියත්වයට පත්වුණු 'සිරස' සුපර් ස්ටාර් ලෙස කිරුළු පළන් අජිත් ගායනා කළේද ප්‍රියා සූරියසේන ගේ ගීතයක් වුවත් ආධුනිකයෙකු වූ ඔහු ගැන ප්‍රියා ප්‍රසිද්ධියේම ප්‍රශංසා මුඛයෙන් කතා කිරීමත් ඔහුගේ නිහතමානීකම වඩාත් තීව්‍ර කළා.

'ආදරණීය නේරංජනා' ගීතය ගයා අවසා-නයේදී එහි අවසාන පද කණ්ඩයේ වන

'කවුදෝ මා පසුපස එනු පෙණුනා<br>
පාළු වීදියේ තනිකම මැකුණා<br>
ජීවමාන කිසිවෙකු සිටියේ නෑ<br>
එනමුදු කවුදෝ ඇති බව හැඟුණා<br>
නිදි යහනේ මා නින්දට වැටුණා<br>
ඔබ මා සිහිනෙන් අමතනු පෙණුනා<br>
එනමුදු කෙලෙසද ඇගෙ අත ගන්නේ<br>
මගේ සිතම මට මුමුණනු ඇසුණා'

යන්නෙහි අරුත ප්‍රසංගය අවසානයේදී පැහැදිලි කරන ලෙස ප්‍රේක්ෂකයන්ට ආරාධනා කළ ප්‍රියා, ප්‍රසංගය අවසානයේදී එය අමතක කර දැමීම නම් කණගාටුවට කරුණක්.

ලංකාවේ සංගීත සංදර්ශණයකදී ගීත තුනක් හෝ ප්‍රේක්ෂක ඉල්ලීම මත එයට තව ගීතයක් එකතු කොට ගීත හතරක් ගායනා කරන ගායකයෙකු, එකවර ගීත විසිපහක් පමණ ගායනා කිරීමත් ඇත්තෙන්ම ඔහුට විශාල මහන්සියක්, වුණත්
ප්‍රසංගය පුරාම ප්‍රේක්ෂකයන්ට ඉතා ඉහළ තෘප්තියක් ලබා දුන් ඔහු, අවසානයේදී ඒ පැනයට පිළිතුරක් ලබා දුන්නා නම්....

කෙසේ වෙතත් ශ්‍රී ලංකාරාමයට ආධාර වශයෙන් පැවැත්වුණු 'රටකින් එහා' ප්‍රසංගය වෙනුවෙන් ඔහු විශාල මුදලක් අය නොකිරීමත්, නැවතත් මෙවැනි ප්‍රසංගයකට ආරාධනාවක් ලදොත් පැමිණෙන බවට දුන් ප්‍රකාශයත් මුදල් මතම කටයුතු නොකරන ගායකයෙකු වශයෙන් ප්‍රියා සූරියසේන ඔහු ගැන අපටද ආඩම්බරයෙන් හිතන්නට පෙළඹවීමක් වැනි විය.

තම මහන්සිය මදක් අමතක කොට ප්‍රේක්ෂකයන් සමඟ සුහද කතා බහක යෙදෙන්නට ප්‍රසංගය අවසානයේදී තව පැය බාගයක් හෝ මිඩංගු කරන්නට ප්‍රියා සූරියසේන ගායකයාණන්ට පුළුවන්කමක් තිබුණා නම්... මීට වඩා ඔහු ගැන කතා කරන්නට යමක් අපට ඉතුරු වේවි.

## QLinkQ වෙතින් ඩයලොග් ග්ලෝබල් දුරකථන කාඩ් පත් දෙකක් ඔබට

## The Challenge

විවේකයට විනෝදයට මේ අභියෝගය විසඳන්න. A රූපය හා B රූපය බැලූ බැල්මට එක හා සමාන ය. නමුත් A රූපයේ නැති වැරදි 10 ක් B රූපයේ ඇත. හැකි නම් ඒ වැරදි 10 සොයාගන්න. B රූපය මත ඒ වැරදි රවුමකින් ලකුණු කරන්න. එසේ ලකුණු කළ B රූපය කපා අපට එවන්න. නිවැරදි විසඳුම් අතරින් තෝරා ගන්නා දෙදෙනෙකුට **QLinkQ** වෙතින් ග්ලෝබල් ඩයලොග් දුරකථන කාඩ්පත බැගින් හිමි වෙයි. අපේ ලිපිනය The Challenge Sannasa 22 Lorne Street Lalor Vic 3075

මේ මාසයේ ජයගත්තෝ

**ශ්‍රී කාන්ති ද අල්විස්**<br>
4 Pinedale Way<br>
Safety Bay WA 6169

**රිෂානි ජයරත්න**<br>
3 Neesan Crt<br>
Hampton Park Vic 3976

**නිවැරදි පිළිතුරු එවූ අය අතරින්**

වසන්තා විජේනායක මාතර

**වික්ටෝරියාවේ**

නෙත්මි මඩවල ක්‍රේගිබර්න්<br>
චන්දි මාපා එයාපෝට් වෙස්ට්<br>
සංජීවනී ජයවර්ධන<br>
කාන්ති ගලගෙදරගේ ග්ලෙන් වේවලි<br>
නතාෂා ජී එපින්<br>
කවීන් අමරකෝන් තෝමස්ටවුන්<br>
සඳලි දිනේෂා මුණසිංහ ඩියර්පාක්<br>
නෙත්මිණි කොතලාවල හැම්ප්ටන් පාක්<br>
පියුමි විමලරත්න හැලම්<br>
ආශා පෙරේරා කිංස්විල්<br>
ගයනි ප්‍රියදර්ශණී හැම්ප්ටන් පාක්

ඊෂාරා විජේසූරිය වොන්ටිර්නා සවුත්<br>
මේරි පද්මලතා පෙරේරා ක්ලේටන්<br>
අමන්දි පෙරේරා සන්බරි<br>
කුමාර ජයසූරිය හැලම්

**ක්වීන්ස්ලන්තයේ**

තිසල් පොල්ගම්පලගේ Durack<br>
අනුර දිසානායක

**නිව්සවුත් වේල්ස්**

ඉෂාරා ජයසේකර එපින්<br>
නිමාෂා පතිරණ

**සවුත් ඔස්ට්‍රේලියා**

සරත් ජයසිංහ

පසුගිය මාසයේ විසඳුම



*සිතුවම - සුනිල් කුමාර අමරකෝන්*

A



B



නම ..............................................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න).......................................................

..............................................................................................